# කැළඹීම් මධ්‍යයෙහි සමාදානය

**යේසුස්වහන්සේ ඔවුන්ට උත්තර දෙමින්, ''කිසිවෙක් නුඹලා මුළා නොකරන ලෙස බලා ගන්න. මක්නිසාද බොහෝ දෙනෙක් 'මම ක්‍රිස්තුස්'ය කියා මගේ නමින් ඇවිත් බොහෝ දෙනෙකු මුළා කරන්නෝය. නොකැළඹෙන්ට බලාගන්න. මක්නිසාද, මේ සියල්ල සිදුවන්ට ඕනෑය; නුමුත් ඒ වන තුරුත් අන්තිමය නො පැමිණෙන්නේය. මක්නිසාද, ජාතියක් ජාතිය කට ද, රාජ්‍යයක් රාජ්‍යයකට ද විරුද්ධව නැගිටිනවා ඇත. නොයෙක් තැන්වල සාගත ද පොළෝ කම්පාද සිදුවෙනවා ඇත.''**

අප අපගේ ලෝකය දෙස බලන විට අපට පෙනෙන්නේ මේ ලෝකය කැළඹීමෙන් පිරුණු ලෝකයක් බවයි. එක රටක් තව රටකට විරුද්ධව යුද්ධ කරයි. බොහෝ රටවල ත්‍රස්තවාදි කණ්ඩායම් එම ආණ්ඩුව බලහත් කාරයෙන් පෙරලන්නට තැත් කරති. ආණ්ඩු අතරෙහි සමාදන ගිවිසුම් ඇති කරන්ට සාකච්ඡා ඇතිවෙති. නමුත්, සමාදනය වෙනුවට කැළඹීම් වැඩි වේ.

**ලෝකයට සිදුවන්නට යන ආපද ගැන බලා සිටීමෙන් සිත් බියෙන් මිනිස්සු ක්ලාන්ත වන්නෝය.**

බොහෝ අය හෘද ආබාධවලින් මැරෙති. මක්නිසාද, ඔවුන් භයෙන් සිටින නිසාය. බොහෝ මිනිසුන් මත් පැනට වහල්ව සිටින්නේ ඔවුන් තමන්ගේ සිතේ තිබෙන කරදර මත්

පැන් පානය කිරීමෙන් නැති කරන්ට තැත් කරන නිසාය. ලෝකයේ තිබෙන කරදර විසඳීමට මාර්ගයක් ඇද්ද? ඇත. ඒ කැළඹීම් වලට විසඳුම ඇත්තේ මේ ලෝකය මැවූ දෙවියන්වහන්සේගේ අතේය.

**පටන්ගැන්මේදී දෙවියන්වහන්සේ අහසත් පොළොවත් මැවූසේක.**

දෙවියන්වහන්සේ නමැති කෙනෙක් සිටින බව මා දැන ගන්නේ කෙසේද? දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාස නොකරන සමහර අය සිටිති. එහෙත් දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාස නොකිරීම නිසා පැන නගින ගැටළු, උන්වහන්සේ කෙරෙහි විශ්වාස කිරීමෙන් ඇති විය හැකි ගැටළුවලට වඩා විසඳීමට අමාරුයි. ජීවනයක් නැති ද්‍රව්‍යයන් මගින් ජීවනය නිපදවූ බව විශ්වාස කිරීම ඉතා අපහසුයි.

උදහරණයක් වශයෙන් නැවක් ගැන සිතන්න. යම් කෙනෙක් ඔබට, ඒ නැව ගැන මෙසේ කථා කරන බව සිතන්න: ''බොහෝ දෙනා සිතන්නේ මේ නැව මනුෂ්‍යයා විසින් සාදා ඇති බවයි. නමුත් එය එසේ නොවේ. යකඩ පොළොවෙන් මතු වී, ඉබේටම එක්කහු වී, ක්‍රමයෙන් මේ නැවේ හැඩයට සැදුණේය. ඒ පිළිවෙලටම එහි යන්ත්‍ර සෑදී, ඒවා නියම තැන්වල සවි විය.'' ඔබ සිතන්නේ මේ තැනැත්තා පිස්සකු කියාය. මක්නිසාද, අප දන්නවා මේ නැව මනුෂ්‍යයන් විසින් සාදා ඇති බව. එසේම, අප, මේ ලෝකය දෙස බලන



විට එය ඉබේටම සෑදුණු බව පිළිගැනීම ඉතා අමාරුය. එය යම් කෙනෙක් සෑදූ බව අපට පෙනේ. අප ඒ තැනැත්තාට කියන්නේ ''දෙවියන්වහන්සේ'' කියාය. එහෙත් බොහෝ දෙනා කියන්නේ ස්වභාවධර්මය තුළ මිස දෙවියන්වහන්සේ තුළ විශ්වාස නො කරන බවයි. මනුෂ්‍යයන් දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාස කරතත් නැතත් උන්වහන්සේ වැඩ සිටින සේක. බොහෝ දෙනා දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාස නොකරන්නේ උන්වහන්සේ කෙරෙහි විශ්වාස කිරීම දුෂ්කර කාරණයක් වන නිසා නොවේ. නැත. ඔවුන් එසේ විශ්වාස නොකරන්නේ දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාස කළොත් උන්වහන්සේට අපගේ ජීවිතය ගැන ගණන් දිය යුතු බව පිළිගත යුතු නිසාය. ඔවුන් ''මට දෙවියන්වහන්සේ ගැන විශ්වාස කරන්ට නො හැක'' කියා කටින් කිව්වත්, ඔවුන් සත්‍යයෙන්ම තමන් තුළ කියන්නේ ''මට දෙවියන්වහන්සේ ගැන විශ්වාස කරන්ට ඕනෑකමක් නැත'' කියාය.

**අඥාණයා, ''දෙවි කෙනෙක් නැතැ''යි සිතින් කීය. ඔවුහු දුශ්චරිතයෙහි සිටිති. ඔවුහු පිළිකුල් ක්‍රියා කළෝය. යහපත කරන්නෙක් නැත.**

මේ ලෝකයේ තිබෙන පොත් අතරින් දෙවියන්වහන්සේ විසින් එළිදරව් කර ඇති පොතක් බවට ප්‍රකාශ වී ඇති එකම පොත, බයිබලයයි. ඒ පොත, දෙවියන්වහන්සේ ගැනත්, අප උන්වහන්සේව පුද්ගලිකව හඳුනා



ගන්නා මාර්ගයත් උගන්වයි. එනිසා, මේ පොතෙන්, මනුෂ්‍යයා ගැනත්, පාපය ගැනත්, පාපිෂ්ඨ මනුෂ්‍යයා විසින් මේ ශුද්ධ වූ දෙවියන්වහන්සේ දැන ගන්නේ කෙසේද කියාත් දැන ගන්ට හැක.

**දෙවියන්වහන්සේ තමන් ස්වරූපයෙන් මනුෂ්‍යයා මැවූ සේක. පුරුෂයාද, ස්ත්‍රියද කොට ඔවුන් මැවූ සේක.**

දෙවියන්වහන්සේ තමාගේ ස්වරූපයට අනුකූලව පුරුෂයා සහ ස්ත්‍රිය මැවූ සේක. එසේ කියන්නේ දෙවියන්වහන්සේට අපට වැනි ශරීරයක් ඇති බව නොවේ. එසේ කියන්නේ උන්වහන්සේ තමාගේ ශුද්ධ පිරිසිදු ස්වභාවයට ගැලපෙන ලෙස මනුෂ්‍යයා සෑදූ බවයි. උන්වහන්සේ මනුෂ්‍යයාව සෑදුවේ පාපය නැතිවයි. දෙවියන්වහන්සේ මනුෂ්‍යයාව සෑදුවේ තමාගේ පාලනයට යටත්ව, තමාගේ අණට කීකරුව ජීවත්වන පිණිසයි. නමුත් දෙවියන්වහන්සේ මනුෂ්‍යයාට නිදහස් කැමැත්තක් දුන් සේක. මනුෂ්‍යයා තමා ලැබූ නිදහස් කැමැත්ත පාවිච්චි කොට, දෙවියන්වහන්සේගේ පාලනයට විරුද්ධව, උන්වහන්සේගේ අණට අකීකරුව ජීවත් වන්ට තෝරා ගත්තේය. එමනිසා, අප සෑම දෙනාම, උත්පත්තියෙන්ම, දෙවියන්වහන්සේගේ පාලනයට විරුද්ධව, උන්වහන්සේගේ අණට අකීකරුව ජීවත්වෙති. මේ අකීකරුකමට කියන්නේ ''පාපය'' කියාය. පාපය නිසා අප මරණය උරුම කොට ඇත. මරණය කියන්නේ විනාශවීම නොව, මරණය කියන්නේ දෙවියන්වහන්සේගෙන් වෙන් වීමය.

**පාපයත් පාපය කරණකොටගෙන මරණයත් ලෝකයට ඇතුල්වුණාක් මෙන්, සියලු**

**මනුෂ්‍යයන් පව් කළ බැවින්, සියල්ලන් කෙරෙහි මරණයද පැමුණුණේය. සියල්ලෝම පව් කොට දෙවියන්වහන්සේගේ මහිමයෙන් හීනව සිටිති.**

අපගේ පාපය නිසා අප දෙවියන් වහන්සේගේ විනිශ්චයට මුහුණ පා, සදහටම නිරයේ දඬුවම විඳිය යුතුයි.

**එක වරක් මරණයත්, ඉන්පසු විනිශ්චයත් මනුෂ්‍යයන්ට නියමව තිබේ.**

නමුත්, දෙවියන්වහන්සේ මේ ලොවට මනුෂ්‍යයෙකු ලෙස ආ සේක. උන්වහන් සේගේ නම වූයේ ''යේසුස්වහන්සේ'' ය. උන්වහන්සේ අපගේ පව් වෙනුවෙන් මැරුණු සේක. එමනිසා, උන්වහන්සේ තුළින් පමණක් අපට අපගේ පව්වලට සමාව ලබාගන්ට හැක. උන්වහන්සේ මළවුන්ගෙන් නැගිටි සේක. එනිසා උන්වහන්සේගේ ආත්මය අපගේ හෘදය තුළට අවුත්, සදාකාලයටම එහි වාසය කරන්ට හැක.

නමුත්, අප අපගේ පව්වලට සමාව ලබා, දෙවියන්වහන්සේගේ ආත්මය අපගේ හෘදය තුළට ඒම පිණිස, අප ශුද්ධ වූ දෙවියන් වහන්සේ ඉදිරියේ පව්කාරයන් බව පිළිගෙන, යේසුස්වහන්සේ අපගේ පව් වෙනුවෙන් මරණීය දඬුවම වින්ද බවත්, උන්වහන්සේ මළවුන්ගෙන් නැගිට්ට බවත් විශ්වාස කොට, අපගේ පව් ගැන අවංක ලෙස පසුතැවිලි වී, උන්වහන්සේට අපගේ ජීවිතයේ පාලනය දිය යුතුයි.

ඔබත් ඔබගේ පව් ගැන අවංක ලෙස පසු තැවිලි වී, යේසුස් ක්‍රිස්තුස් ස්වාමීන්වහන්සේට



ඔබගේ ජීවිතයේ පාලනය දී, උන්වහන්සේ ඔබගේ පුද්ගලික ගැළවුම්කාරයා ලෙස පිළි ගන්ට කැමති නම් උන්වහන්සේට මෙසේ කථා කරන්න.

**ආදරණීය යේසුස්වහන්ස, මම පව්කාර යෙකු බව පිළිගනිමි. ඔබවහන්සේ, මගේ පව් වෙනුවෙන් මරණීය දඬුවම වින්ද බව මම විශ්වාස කරමි. ඔබවහන්සේ මළවුන්ගෙන් නැගිට්ට බව මම විශ්වාස කරමි. මම, මගේ පව් ගැන, අවංක ලෙස, පසුතැවිලි වෙමි. ඔබ වහන්සේට මගේ ජීවිතයේ පාලනය දෙමි. මගේ පව්වලට, මට සමාවන්න. මගේ හෘදය තුළට එන්න.**

ඔබ, ඔබගේ පව් ගැන අවංක ලෙස පසු තැවිලි වී, යේසුස් ක්‍රිස්තුස් ස්වාමීන්වහන්සේට ඔබගේ ජීවිතයේ පාලනය දී, උන්වහන්සේව ඔබගේ පුද්ගලික ගැළවුම්කාරයා ලෙස පිළි ගත්තා නම් පහත සඳහන් ලිපිනයට ලියන්න.